[අටවැනි පාර්ලිමේන්තුව (සිව්වැනි සභාවාරය) - පළමුවැනි රැස්වීම]
අංක 1.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2020 ජනවාරි 03 වැනි සිකුරාදා පූ.භා. 10.00 ට

අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව විවෘත කරන හෙයින් මන්ත්‍රීවරයන් පූ.භා. 10.00 ට පාර්ලිමේන්තු සභා ගර්භයෙහි රැස්වීමෙන් මෙදින වැඩ කටයුතු ආරම්භ කරනු ලැබේ.

දිනට නියමිත වැඩ පිළිවෙළ මෙසේ ය:—

**1.** **පාර්ලිමේන්තුව වාරාවසාන කිරීමේ සහ රැස්වීම කැඳවීම පිළිබඳ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රකාශනය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් කියවනු ලැබීම.**

**2.** **අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව අමතනු ලැබීම.**

**3.** රැස්වීම තාවකාලිකව අත්හිටුවීම.

**4.** රැස්වීම නැවත ආරම්භවීම (අ.භා. 1.00).

---

**පාර්ලිමේන්තුව අ.භා. 1.00ට නැවත ආරම්භ වීමෙන් අනතුරුව...**

## 2020 ජනවාරි 03 වැනි සිකුරාදා අ.භා. 1.00 ට

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සහජීවනය සහතික කිරීම පිණිස ඒ පිළිබඳව අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 2018 සැප්තැම්බර් 07 දින කථානායකවරයා විසින් පත්කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සහජීවනය සහතික කිරීම පිණිස ඒ පිළිබඳව අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව, තමන් විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2018 සැප්තැම්බර් 04 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුවට අතුරු වාර්තාවක් මඟින් ඉදිරිපත් කර ඇති අතර අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමට එම කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව, 2020 ජුලි 12 දින දක්වා දීර්ඝ කළ යුතු ය.

---